**ශීර්ෂය 254 - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

---

## 1. **මූල්‍ය ප්‍රකාශන**

### 1.1 **තත්ත්වාගණනය කළ මතය**

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබූ රු. 39,335,787 ක බැරකම් භාණ්ඩාගාරයට වාර්තා කර නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බැදීම් හා බැරකම් භාණ්ඩාගාර ප්‍රකාශය සමඟ එකඟ විය යුතු වීම. | චක්‍රලේඛ උපදෙස් අනුව ඉදිරියේදී සියළු බැරකම් භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීමට සටහන් කර ගනිමි. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)හිඟහිටි ආදායමෙහි ප්‍රධාන කාර්යාල වාර්තා හා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වාර්තා අතර රු. 7,131,786 ක වෙනසක් පැවතීම සහ හිඟහිටි ආදායම සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ වාර්තා හා කේවල ශේෂ ලේඛන සකස් කර නොතිබීම, යනාදී කරුණු හේතුවෙන් හිඟහිටි ආදායම නිවැරදි බවට සනාථ කළ නොහැකි විය. | මුදල් රෙගුලාසි 175 (2) ප්‍රකාරව ආදායම් එකතු කරන නිලධාරියා කටයුතු කළ යුතු වීම. | හිඟහිටි ආදායම සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ වාර්තා හා කේවල ශේෂ ලේඛන ඉදිරියේදී නිවැරදි ලෙස ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත. |
| (ආ)හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාල මඟින් | හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලවල බැංකු තැන්පත් | 2019 වර්ෂයේ සිට සියළුම වාර්තා නිසි පරිදි ලබා ගැනීමට |

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ආදායම් රැස්කිරීමේ බැංකු ගිණුමට බැරකර තිබූ රු. 3,355,634 ක් හඳුනාගෙන නොතිබුණු අතර, කාර්යාල 09 කින් ආදායම් වාර්තා එවා නොතිබුණි. ඒ හේතුවෙන් හිමිකම් ආදායමින් සියයට 60 ක් වශයෙන් ඒකාබද්ධ අරමුදලට මාරුකළ රු. 15,643,917 ක නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය. | පත්‍රිකා හා ආදායම් වාර්තා සමඟ නිවැරදිව සැසඳීම් කර නිවැරදි ආදායම හඳුනාගත යුතු වීම. | අවශ්‍ය කටයුතු යොදා ඇත. |

### 1.6.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)දෙපාර්තමේන්තුවේ වත්කම් සමීක්ෂණ කටයුතු අවසන් කර නොතිබීමත්, වෙනත් අමාත්‍යාංශ 03 ක ප්‍රතිපාදන යටතේ මිලදී ගෙන තිබූ වත්කම් ඇතුළත් කර නොතිබීමත්, මූල්‍ය ප්‍රකාශවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත්ව තිබූ වත්කම් වර්ග ගණනාවකම ආරම්භක ශේෂය, අත්පත් කර ගැනීම් හා අවසාන ශේෂයන්හි ප්‍රමාණාත්මක වෙනස්කම් පැවතීමත් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු. 2,182,960,444 ක දේපල පිරියත හා උපකරණ වටිනාකමෙහි නිවැරදිතාවය සනාථ නොවුණි. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් මූල්‍ය නොවන වත්කම් වටිනාකම, වත්කම් සමීක්ෂණය මඟින්ද, ස්ථාවර වත්කම් ලේඛන මඟින්ද, ඒසීඒ-6 දරන මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය මඟින්ද සනාථ විය යුතු වීම. | නිලධාරීන්ගෙන් තොරතුරු තහවුරු කර ගැනීමේදී සිදු වූ අතපසුවීම් හේතුවෙන් වාර්තා වූ මෙම තත්ත්වයන් ඉදිරියේදී ඇති නොවන ලෙස කටයුතු කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |
| (ආ)රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය | අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට පියවර ගෙන ඇත. |

| | |
|---|---|
| පවත්වාගෙන යනු ලබන වත්කම් වාර්තාවට රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සතු වත්කම් ඇතුළත් කර නොතිබීමෙන් දෙපාර්තමේන්තුවේ වත්කම් ජනරජ ගිණුමට ඇතුළත් වී නොතිබුණි. 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව සතු ඉඩම් හා ගොඩනැඟිලි කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා වෙත වාර්තා කර නොතිබුණි. | ගිණුම් චක්‍රලේඛය හා වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් පිළිබඳ නිවැරදි දත්ත ඇතුළත්ව ගිණුම් සකස් කර භාණ්ඩාගාරයට වාර්තා කළ යුතු වීම. |

**1.6.4. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරුණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2018 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී ගිය, මියගිය, විශ්‍රාමගිය, වැඩ තහනම් කළ, සේවයෙන් පහ කළ, සේවය හැරගිය හා ඉල්ලා අස්වූ නිලධාරීන් 84 දෙනෙකුගේ මාස 03 ක සිට වර්ෂ 28 ක් අතර කාල පරාසයක සිට අයවීම් හිඟහිටව තිබුණු ණය ශේෂ එකතුව රු. 2,939,823 ක් විය. | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1 හා 3 ඡේද ප්‍රකාරව හා ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කර හිඟහිටි ණය ශේෂ නිරවුල් කළ යුතු වීම. | රු. 10,000 ට අඩු ණය ශේෂ කපා හැරීමටත්, ලිපි මඟින් නිලධාරීන් දැනුවත් කර අයකර ගැනීමටත් පියවර ගෙන ඇත. |

### 1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ)ස්ථාවර වත්කම් ලේඛනය** | | |
| ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/ මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනය අදාළ වන පරිදි විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව පවත්වා ගත යුතු වීම. | ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කළ යුතු ඉඩම් හා ගොඩනැඟිලි වත්කම් ඇතුළත් කිරීමට පියවර ගෙන ඇත. |
| **(ආ) ඇප ලේඛනය** | | |
| ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 880 **(i)** හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | මුදල් රෙගුලාසි 880 සඳහන් විධිවිධාන ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන ඇප තැබීමට අවශ්‍ය පියවර ගෙන ඇත. |

### 1.6.6 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ)දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර, සමාලෝචනය කර ඒ අනුව සඵලදායීතාවය වැඩිකර ගැනීමට අවශ්‍ය වෙනස්කම් සිදුකර එය ලිඛිතව විගණකාධිපති වෙත |

| | | |
|---|---|---|
| යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | ඉදිරිපත් කිරීමට සටහන් කර ගෙන ඇත. |
| (ආ)විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | -එම- | සමාලෝචිත කාල සීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට ඉදිරියේදී පිළිතුරු සැපයීමට සටහන් කර ගෙන ඇත. |

### 1.6.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නිරීක්ෂණය** | | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ)නොතාරිස් ආඥාපනත | | | |

| | | | |
|---|---|---|---|
| (i) 18 (1) වගන්තිය | මහාධිකරණ කලාප 07 ක 2017 හා 2018 වර්ෂයන්හි නොතාරිස් නාමාවලීන් ගෙන්වා ගෙන නොතිබූ අතර සෑම වර්ෂයකම අප්‍රේල් මස ප්‍රසිද්ධ කළයුතු නොතාරිස් නාමාවලිය පසුගිය වර්ෂ කිහිපය තුළදීම නියමිත පරිදි ප්‍රසිද්ධ කර නොතිබුණි. | නොතාරිස් ආඥා පනතේ 18 (1) වගන්තිය ප්‍රකාරව යම් දිස්ත්‍රික්කයක් ඇතුළත නොතාරිස්වරුන් වශයෙන් ක්‍රියා කිරීමට බලය පවරන ලද සියළුම තැනැත්තන්ගේ නාමවලියක් මහජනයාගේ දැනගැනීම පිණිස ප්‍රදර්ශනය කර තැබිය යුතු වීම. | සියළුම මහාධිකරණවලින් නොතාරිස් නාමාවලීන් ගෙන්වාගෙන එම නාමාවලිය ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන බව. |
| (ii) 27 (1) වගන්තිය | නොතාරිස්වරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට මහාධිකරණ ලේකම්වරයාගේ බලපත්‍රයක් ලබාගත යුතු වුවත් 2017 හා 2018 වර්ෂයන්හි කාර්යාල 08 ක බලපත්‍ර ලබා නොගත් නොතාරිස්වරුන් සංඛ්‍යාව 221 ක් විය. ඉන් නොතාරිස්වරුන් 10 දෙනෙකු 2018 වර්ෂයේදී ඉඩම් ඔප්පු 196 ක් ලියාපදිංචි කර තිබුණි. | 27 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නොතාරිස් බලපත්‍ර ලබා නොගෙන ඉඩම් ඔප්පු ලියා ඇති නොතාරිස්වරුන් පිළිබඳව මහාධිකරණ වෙත වාර්තා කරන ලෙසට ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කර ඇත. |
| (iii) 31 (26) වගන්තිය හා රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්පොතේ 374 (1), (3) හා 375 වගන්ති | ඔප්පු ලියන ලද මාසයට පසු මාසයේ 15 වැනි දිනට පෙර අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත ඔප්පුවල දෙවන පිටපත් හෝ ලියා නැත්නම් හිස් වාර්තා භාර දී නැති නොතාරිස්වරයන් සම්බන්ධයෙන් විධිහීනතා වාර්තා සකස් කර අදාළ ක්‍රියාමාර්ග ගත යුතුයි. එසේ වුවද හොරණ, කළුතර හා | නොතාරිස් ආඥාපනතේ හා රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්පොතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඔප්පු දෙවන පිටපත් නිසි ලෙස භාරදෙන බවට හා ප්‍රමාදවීම් සම්බන්ධයෙන් විධිහීනතා වාර්තා පිළියෙල කර අවශ්‍ය කටයුතු ඉටුකරන ලෙස ඉඩම් රෙජිස්ට්‍රාර්වරු වෙත දන්වා යවා ඇත. |

| | | | |
|---|---|---|---|
| | මතුගම යන ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවල එසේ කටයුතු නොකළ අවස්ථා 3,566 ක් නිරීක්ෂණය විය. | | |
| (iv) 35 වගන්තිය හා රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්පොත 15 හා 18 වගන්ති | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 02 ක නොතාරිස්වරුන් 34 දෙනෙකුගෙන් 2009 - 2018 කාලයට අදාළව අයවිය යුතු සමථ මුදල් රු. 1,256,678 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නොතාරිස් අඥාපනතේ හා රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්පොතේ වගන්ති ප්‍රකාරව කටයුතු කර සමථ මුදල් අයකර ගත යුතු වීම. | අයකර ගැනීමට ඇති සමථ මුදල් අයකර ගැනීමට පියවර ගන්නා ලෙස අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කර ඇත. |
| (v) 41(1)(අ),(ආ) හා 18(2) වගන්ති සහ රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්පොතේ 33 හා 34 වගන්ති | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 02 ක මියගිය නොතාරිස්වරුන් 06 දෙනෙකු විසින් ලියා සහතික කරන ලද ඔප්පුවල තෙවන පිටපත් ලබා ගැනීමට ද, මියගිය නොතාරිස්වරුන් 04 දෙනෙකුගේ නම් නොතාරිස් නාමාවලියෙන් ඉවත් කිරීමටද කටයුතු කර නොතිබුණි. | නොතාරිස් අඥාපනතේ හා රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්පොතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මිය ගිය නොතාරිස්වරුන් විසින් ලියා සහතික කළ ඔප්පු තෙවන පිටපත් භාර ගැනීමට කටයුතු යොදන ලෙස ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කර ඇත. |
| (ආ) 117 වැනි අධිකාරිය වන ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත<br>-------------------- | | | |
| 5 වැනි වගන්තිය හා රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ | හොරණ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 2010- | ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත හා රෙජිස්ට්‍රාර් | භාරදෙන ලද ඔප්පු දෙවන පිටපත් වෙළුම් කර අවසන් කිරීමට |

| | | | |
|---|---|---|---|
| අත්පොතේ 548 වැනි වගන්තිය | 2017 කාලයට අදාළව භාරදෙන ලද ඔප්පු දෙවන පිටපත් 114,321 ක් 2018 දෙසැම්බර් වන විටත් වෙළුම් කර නොතිබූ අතර, දිරාපත් වී ඇති 150,000 කට අධික ඔප්පු දෙවන පිටපත් පිළිබඳව රෙජිස්ට්‍රාර් ජනරාල්ට වාර්තා කර නොතිබුණි. | ජනරාල්ගේ අත්පොතේ වගන්ති ප්‍රකාරව රෙජිස්ට්‍රාර්වරයන් විසින් භාරදෙන ඔප්පුවල දෙවැනි පිටපත් හා අනෙකුත් ලිපි ලේඛන සියල්ලම පහසු ප්‍රමාණයේ වෙළුම්වලට බන්දවා ආරක්ෂිතව තබා ගත යුතු වීම. | කටයුතු කරන ලෙසත් දිරාපත් වී ඇති දෙවන පිටපත් පිළිබඳ වාර්තා රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත වාර්තා කරන ලෙසත් ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කර ඇත. |
| (ඇ)රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්පොත<br>----------------- | | | |
| 440 (2) වගන්තිය | එක් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයක නොතාරිස්වරුන් ඔප්පුවලට අඩුවෙන් මුද්දර ගැසීම හේතුවෙන් වර්ෂ 6 කටත් අධික කාලයක සිට අයවිය යුතුව පැවති හිඟ හා දඩ මුදල් රු. 3,599,555 ක් අයකර ගෙන පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත යොමු කිරීමට කටයුතු කර නොතිබුණි. | රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්පොතේ වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අයවිය යුතුව ඇති හිඟ හා දඩ මුදල් පිළිබඳ වාර්තා පළාත් ආදායම් කොමසාරිස් වෙත යවන ලෙස ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) දෙපාර්තමේන්තුව විසින් පුරෝකථනය කළ ලියාපදිංචි කිරීමේ ගාස්තු හා නොතාරිස් ගාස්තු ආදායම පිළිවෙලින් රු. මිලියන 1,100 ක් හා රු. මිලියන 15 ක් විය. එසේ වුවද, භාණ්ඩාගාරය විසින් ලියාපදිංචි කිරීමේ ගාස්තු ආදායම රු.මිලියන 1,500 ක් ලෙස පුරෝකථනය කර වාර්ෂික ඇස්තමේන්තුවට ඇතුළත් කර තිබුණි. සංශෝධිත ආදායම් ඇස්තමේන්තු සකස් කර නොතිබූ අතර, තත්‍ය ආදායම් රැස්කිරීම පිළිවෙලින් රු. මිලියන 1,403 ක් හා රු. මිලියන 19.4 ක් විය. | මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් ආදායම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරීම හා අදාළ වන පරිදි සංශෝධනයන් කළ යුතු අතර, රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයන්හි විධිවිධාන අනුගමනය කර ආදායම් පරිපාලනය වඩාත් කාර්යක්ෂමව කිරීමට කටයුතු කළ යුතු වීම. | ආදායම් ඇස්තමේන්තු නිවැරදිව ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟහිටි ආදායම රු. මිලියන 27.22 කින් වර්ෂය තුළ අයකර ගැනීම් රු. මිලියන 6.29 ක් හෙවත් සියයට 23 ක් පමණක් විය. | හිඟහිටි ආදායම් කේවල ශේෂ ලේඛන හා කාල විශ්ලේෂණ සකස් කර හිඟහිටි ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | හිඟහිටි ආදායම සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ වාර්තා හා කේවල ශේෂ ලේඛන ඉදිරියේදී නිවැරදි ලෙස ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වාහන නඩත්තු වැය විෂයයට මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව මාරු කර ගත් රු. 400,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | අවශ්‍යතාවය හඳුනාගෙන මාරු කිරීම් කළ යුතු වීම. | වාහනයක අළුත්වැඩියා කටයුතු වර්ෂය තුළ අවසන් නොවීම මත ගෙවීම් කිරීමට නොහැකි විය. |
| (ආ) ප්‍රාග්ධන වැය විෂයයන් 04 ක රු. මිලියන 29.59 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය රු. මිලියන 20.20 ක් වූයෙන්, ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 ක සිට සියයට 80 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. තවද, පුනරාවර්තන වැය විෂයයන් 06 ක රු. මිලියන 20.30 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 3.0 ක් ඉතිරි වී තිබූ අතර, වැය විෂයයන් අතර එම ඉතිරිවීම සියයට 11 ක සිට සියයට 60 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වැය විෂය ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | ප්‍රතිපාදන වෙන්කළ අළුත්වැඩියා කටයුතු ඉටු නොවීම, අක්මුදල් නොලැබීම, බිල්පත් ඉදිරිපත් නොවීම ආදිය හේතු විය. |

**2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2017 අප්‍රේල් 29 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 (අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 13 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 293.83 ක ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා රු. මිලියන 36.50 ක බැරකම් ඇතිකර ගෙන තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව බැඳීම් හා බැරකම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. | චක්‍රලේඛ උපදෙස් අනුව ඉදිරියේදී කටයුතු කිරීමට සටහන් කර ගත්තෙමි. |
| (ආ)සමාලෝචිත වර්ෂයට අදාළව වැය විෂයයන් 10 ක් යටතේ ගෙවිය යුතු රු.මිලියන 6.47 ක් සඳහා බැරකම් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි. | ගෙවිය යුතු වියදම් වෙනුවෙන් බැරකම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර භාණ්ඩාගාරයට වාර්තා කළ යුතු වීම. | ගිණුම් ඉදිරිපත් කරන අවස්ථාව වන විට ලැබී තිබූ සියළු බැරකම් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ක්‍රියාකාරී සැලස්ම සකස් කළ යුතු වීම. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීමට සටහන් කරගෙන ඇත. |
| (ආ) E- title ව්‍යාපෘතිය යටතේ හිමිකම් ලියාපදිංචි කිරීමේ | භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙන්කරගත් ප්‍රධාන | ලියාපදිංචි කිරීමේ කාර්යය ක්‍රියාකාරී සැලැස්මේ වෙනම |

| | | |
|---|---|---|
| කාර්යාල 27 ක් මගින් සිදුකරනු ලබන හිමිකම් සහතික ලියාපදිංචි කර නිකුත් කිරීමේ කාර්යය සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා ඉඩම් අමාත්‍යාංශය මගින් ලබාදුන් රු. මිලියන 30.10 ක ප්‍රතිපාදනයෙන් රු. මිලියන 23.46 ක් උපයෝජනය කර තිබුණි. | කාර්යයන් භෞතික හා මූල්‍ය ඉලක්කයන් සහිතව ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතු වීම. | දක්වා නැත. |
| (ඇ) සකස් කර තිබූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි කාර්යයන් 8 ක් සඳහා භෞතික හා මූල්‍ය ඉලක්කයන් ද, කාර්යසාධන වාර්තාවෙහි කාර්යයන් 11 ක් සඳහා භෞතික හා මූල්‍ය තත්‍ය අගයන් ද දක්වා නොතිබීම හේතුවෙන් එම කාර්යයන්හි කාර්යසාධන මට්ටම ලඟාකරගත් බවට සනාථ කරගත නොහැකි විය. | භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙන්කරගත් ප්‍රධාන කාර්යයන් භෞතික හා මූල්‍ය ඉලක්කයන් සහිතව ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතු අතර භෞතික හා මූල්‍ය ප්‍රගතිය ප්‍රගති වාර්තා මගින් හෙළිදරව් කළ යුතු වීම. | චක්‍රලේඛ උපදෙස් පරිදි ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට සටහන් කරගත් බව දන්වමි. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) 2012 වර්ෂයේ සිට උපත් හා මරණවලට අදාළව ඉ-ජනගහන ලේඛන වැඩසටහන ආරම්භ කර තිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2012 ජූලි මාසයේ සිට 2018 දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ | සංවර්ධනය කළ යුතු අංග හඳුනාගෙන විධිමත් සැලසුම් ප්‍රකාරව අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරවා ගෙන වැඩසටහනින් අපේක්ෂිත අරමුණ කරා කාර්යක්ෂමව මෙහෙයවීමට කටයුතු කළ යුතු වීම. | දත්ත ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. |

| | | |
|---|---|---|
| සිදු වූ උපත් 2,385,232 කින් උපත් 1,533,568 ක හා මරණ 918,644 කින් මරණ 543,131 ක තොරතුරු පද්ධතියට ඇතුළත් කර නොතිබුණි. මෙම වැඩසටහන සඳහා 2016 හා 2017 වර්ෂයන්හි වෙන්කර තිබූ රු.මිලියන 72.02 කින් රු.මිලියන 71.09 ක් හෙවත් සියයට 98.7 ක් උපයෝජනය කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන්කර ගෙන නොතිබුණි. | | |
| (ආ) 1960 වර්ෂයෙන් පසුව සිදු වූ උපත්, විවාහ හා මරණ සහතිකපත් පරිලෝකනය කර, සහතිකපත් නිකුත් කිරීම ඉ - උපත්, විවාහ හා මරණ වැඩසටහන මඟින් අපේක්ෂා කර තිබූ නමුත්, 2014 වර්ෂයේ සිට 2018 මැයි මාසය දක්වා කාලයට අදාළ සහතිකපත් 3,423,590 ක් පරිලෝකනය කර දත්ත පද්ධතියට ඇතුළත් කර නොතිබුණි. මෙම වැඩසටහන සඳහා 2016 හා 2017 වර්ෂයන්හි ප්‍රතිපාදිත රු. මිලියන 260 කින් රු. මිලියන 250.56 ක් හෙවත් සියයට 96 ක් උපයෝජනය කර නොතිබූ අතර, 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන්කරගෙන නොතිබුණි. | -එම- | 2016 හා 2017 වර්ෂයන්හි ප්‍රතිපාදනය උපයෝජනය කර නොගැනීමෙන් ඇති වූ මෙම තත්ත්වය යාවත්කාලීන කර ගැනීමට දෙපාර්තමේන්තුව වෙත 2019 වර්ෂයේ ප්‍රතිපාදන වෙන්ව ඇත. |
| (ඇ)හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාල මඟින් සමාලෝචිත වර්ෂයේදී ලියාපදිංචි කරන ලද උපලේඛන 53,004 කින් උපලේඛන 48,014 ක් | හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යයන් ප්‍රමාදවීම කෙරෙහි බලපා ඇති හේතු සොයාබලා අවශ්‍ය පිළියම් යොදා කටයුතු කාර්යක්ෂම කළ යුතු වීම. | හිමිකම් ලියාපදිංචි කිරීම පෙර වර්ෂවලට අදාළව ද යන්න පිළිබඳ වාර්තා තබා ගැනීමක් සිදු කර නැත. |

| | | |
|---|---|---|
| පෙර වර්ෂයේ ලද උපලේඛන වූ අතර, සමාලෝචිත වර්ෂයේ ලද උපලේඛන 55,904 කින් 50,914 ක් හෙවත් සියයට 91 ක් වර්ෂය අවසාන වන විටත් ලියාපදිංචි කිරීමට නොහැකි වී තිබුණි. | | |
| (ඇ)ඇටෝර්නි බලපත්‍ර සහතික පිටපත් නිකුත් කිරීම, ඇටෝර්නි දෙවන පිටපත් පරීක්ෂාව, ඔප්පු දෙවන පිටපත් පරීක්ෂාව හා ඇටෝර්නි ලේඛන උදෘත පිටපත් නිකුත් කිරීම යන කාර්යයන් 4 හි භෞතික ඉලක්කයන්ට ළඟා නොවීම පිළිවෙලින් සියයට 46 ක්, 50 ක්, 98 ක් හා 99 ක් විය. | අපේක්ෂිත ඉලක්කයන්ට ලඟා නොවීම කෙරෙහි බලපා ඇති හේතු සොයාබලා අවශ්‍ය පිළියම් යෙදිය යුතු වීම. | ක්‍රියාකාරී සැලැස්ම සකස්කිරීම හා ප්‍රගතිය වාර්තා කිරීම නිවැරදිව සිදුකර නොමැති බැවින් මෙම තත්ත්වය වාර්තා වේ. |
| (ඉ) ඉ-ලැන්ඩ් ව්‍යාපෘතිය යටතේ ඩිජිටල් ක්‍රමවේදයක් තුළ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයන්හි සියළුම පත්ඉරු හා ඔප්පු පිටපත් පරිලෝකනය කිරීම හා ඒ ආශ්‍රයෙන් පිටපත් නිකුත් කිරීමට අපේක්ෂා කර තිබුණි. එසේ වුවද, ඔප්පු පිටපත් පරිලෝකනය නොකළ අතර පරිලෝකනය නොකළ පත්ඉරු ප්‍රමාණය මිලියන 25 කට ආසන්න විය. | අපේක්ෂිත ඉලක්කයන්ට ලඟා නොවීම කෙරෙහි බලපා ඇති හේතු සොයාබලා අවශ්‍ය පිළියම් යෙදිය යුතු වීම. | කාර්යාල 20 ක පරිලෝකනය කරන ලද පත්ඉරු ආශ්‍රයෙන් පිටපත් නිකුත් කිරීමේ කටයුතු මෙම වර්ෂයේ ජූලි මස සිට ආරම්භ කිරීමටත් ඔප්පු දෙවන පිටපත් පරිලෝකනය කිරීමටත් අවශ්‍ය කටයුතු යොදා ඇත. |

## 3.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)2006 රජයේ ප්‍රසම්පාදන | මාර්ගෝපදේශ සංග්‍රහය | 2006 රජයේ ප්‍රසම්පාදන |

| | | |
|---|---|---|
| මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ), (ආ) හා (ඇ) මාර්ගෝපදේශයන් ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබූ අතර, 4.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහනක් සකස්කර තිබුණද, සිදුකර තිබූ ප්‍රසම්පාදනයන් ඊට අනුකූල නොවීය. | ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැසුම් සකස් කර අදාළ ප්‍රසම්පාදනයන් සිදු කළ යුතු වීම. | මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ), (ආ) හා (ඇ) මාර්ගෝපදේශයන් ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැසුම් සකස් කර අදාළ ප්‍රසම්පාදනයන් සිදු කිරීමට සටහන් කර ගෙන ඇත. |
| (ආ)දෙපාර්තමේන්තුවේ ආරක්ෂක සේවාව හා සනීපාරක්ෂක සේවාව සැපයීම සඳහා වූ ප්‍රසම්පාදනයන්වලදී 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.13 හා 6.2.2 මාර්ගෝපදේශයන්ගෙන් බැහැරව එකතුව රු. 600,000 ක් අඩුවෙන් ලංසු සුරක්ෂණ ඇපකර ලබාගෙන තිබූ අතර, ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය සඳහා වූ 2017 මාර්තු 15 දිනැති අතිරේක අංක 33 ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. | මාර්ගෝපදේශයන් ප්‍රකාරව ලංසු සුරක්ෂණයන් ලබා ගැනීමටත්, ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහ අතිරේකය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමටත් කටයුතු කළ යුතු වීම. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කිරීමට සටහන් කර ගෙන ඇත. |

### 3.4 වත්කම් කළමනාකරණය
---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>------------------------ | නිර්දේශය<br>----------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>----------------------------- |
|---|---|---|
| (අ)ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර තිබූ ඉඩම් හා ගොඩනැඟිලි 15 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමටත්, දෙපාර්තමේන්තුව සතු ඉඩම් හා ගොඩනැඟිලි දේපල 09 ක වටිනාකම | ඉඩම් හා ගොඩනැඟිලිවල අයිතිය පවරා ගැනීමට සතු දේපල ස්ථාවර වත්කම් ලේඛනයට හා ගිණුම්වලට ඇතුළත් කිරීමටත් කටයුතු කළ යුතු වීම. | දේපලවල නීත්‍යානුකූල අයිතිය දෙපාර්තමේන්තුවට පවරා ගෙන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට පියවර ගෙන ඇත. |

| | | |
|---|---|---|
| ගණනය කර ස්ථාවර වත්කම් ලේඛනයට හා ගිණුම්වලට ඇතුළත් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | | |
| (ආ)දෙපාර්තමේන්තුවේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල හා කලාප කාර්යාල 11 ක් වර්ෂ ගණනාවක් තිස්සේම කුලියට ලබාගත් ගොඩනැඟිලිවල පවත්වාගෙන යනු ලබන අතර, සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ කුලිය රු. මිලියන 16.44 ක් විය. | රජයේ කාර්යාල පරිශ්‍රවලින් ඉඩකඩ වෙන්කර ගැනීමට හෝ දේපල අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | රජයේ ගොඩනැඟිලි නොලැබීම හේතුවෙන් එම කාර්යාල කුලියට ලබාගත් ගොඩනැගිලිවල පවත්වාගෙන යාමට සිදුව ඇති බව |

**3.5 කළමනාකරණ දූර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07 කට අයත් උප්පැන්න, මරණ හා විවාහ රෙජිස්ට්‍රාර් කොට්ඨාශ 14 ක 2019 ජනවාරි මස වන විට මාස 04 ක සිට වර්ෂ 03 ක් දක්වා කාල පරාසයක් තුළ රෙජිස්ට්‍රාර් තනතුර පුරප්පාඩු වී පැවතුණි. | නිසි පරිදි රෙජිස්ට්‍රාර්වරුන් පත්කිරීම හා පුරප්පාඩු පිරවීම සිදුකර මහජන සේවාව නිසි පරිදි ඉටුකළ යුතු වීම. | පුරප්පාඩු පිරවීමට අවශ්‍ය පියවර ගෙන ඇත. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දී ඇති | චක්‍රලේඛ ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදු කිරීම කළ යුතුය. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්ම |

| | | |
|---|---|---|
| “තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030 ” ට අනුගත වීම සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කර ඇති 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත හා රජය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව රාජ්‍ය ආයතන විසින් 2016 වර්ෂයේ සිට තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කළ යුතු වුව ද දෙපාර්තමේන්තුව විසින් ඒ පිළිබඳව දැනුවත් වී නොතිබුණි. අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම ඇතුළුව තිරසර සංවර්ධන ඉලක්කයන්ට ලඟා වීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | පිළියෙල කර ඉලක්කයන්ට ළඟාවීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙල සකස් කරනු ඇත. |

**5. යහපාලනය**

**5.1 විගණන හා කළමනාකරණ කමිටුව**

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ විගණන හා කළමනාකරණ කමිටුව විසින් විගණකාධිපති වාර්තා සමාලෝචනය කර අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009(I)(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටුව විසින් විගණකාධිපති වාර්තා සමාලෝචනය කිරීමේ කටයුතු 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට සටහන් කරගෙන ඇත. |

**6. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු තනතුරු 216 ක් වූ අතර ඉන් 23 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය. එම තනතුරු දීර්ඝ කාලයක සිට පුරප්පාඩුව පවතින අතර, එහි ප්‍රතිශතය සියයට 56 ක් විය. | තනතුරු පුරප්පාඩු පුරවා ගෙඩන දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂම කර ගත යුතුය. | දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරුවල පවතින සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරු සීමිත තරඟ විභාගය යටතේ පුරවා ගැනීමට අවශ්‍ය මූලික පියවර මේ වනවිට ගෙන ඇත. |
| (ආ) දෙපාර්තමේන්තුවේ ගණන්දීමේ නිලධාරියා වන රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර සඳහා ස්ථිර නිලධාරියකු පත් නොකර 2017 වර්ෂයේ ජනවාරි මාසයේ සිට රාජකාරි ආවරණය කිරීමේ හා වැඩ බැලීමේ පදනමින් පවත්වා ගෙන එමින් තිබුණි. | තනතුරු පුරප්පාඩු පුරවා ගෙන දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂම කර ගත යුතුය. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර 2017 වර්ෂයේ සිට රාජකාරී ආවරණය කිරීමේ හා වැඩ බැලීමේ පදනමින් පවත්වාගෙන යාමට සිදු ව ඇත. |